# ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩුව සහ ඉදිරියේ ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ ව්‍යවස්ථාව යටතේ, කොමිෂන් සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ *'ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම'* නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 පෙබරවාරි 20 දින හෝ එදිනට පෙර,**

> **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
> **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
> **ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
> **ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ**

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරනු ලැබිය යුතුය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂය වශයෙන් *'ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම'* යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

2026.02.05